# සිංහල හා හින්දු විවාහ මංගල උත්සවයන්හිදී භාවිත සංස්කෘතික යෙදුම්වල සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක්

*ආරියරත්න, ආර්. එම්. ඩී.* [1] *සහ චාරංගා, ජේ. එම්. එන්. එම්.* [2]

විවාහය යනු නව පරපුරක ආරම්භයකි. එබැවින් ශක්තිමත් ආරම්භයක් මත ගොඩනගන නව පරපුරක් පිළිබඳ අවශ්‍යතාව බෞද්ධ ධර්මයෙහි මෙන්ම හින්දු ධර්මයෙහිද විවාහය අරභයා ඔවුන් අනුගමනය කරන දාර්ශනික වතාවත් හා සිරිත්-විරිත් තුළ පවතී. සිංහල සංස්කෘතිය බෞද්ධ ආගමික හරයන් පදනම් කොටගෙන සකස් වූවක් වන අතර, හින්දු සංස්කෘතිය හින්දු ආගමික දර්ශන පාදක කොටගෙන නිර්මාණය වූවකි. සිංහල බෞද්ධයන්ටත්, හින්දු භක්තිකයන්ටත් ඉතාමත් ප්‍රෞඪ සංස්කෘතික උරුමයන් පවතී. උපතේ සිට මරණය දක්වා මාහැඟි සංස්කෘතියක් උර දරා ගමන් කරන මෙම ජාතීන් දෙකෙහිම සංස්කෘතික වැදගත්කමක් උසුලන අවස්ථාවක් ලෙස විවාහ මංගල්‍ය උත්සවය දැක්විය හැකිය. සිංහල බෞද්ධ මංගල්‍ය උත්සවයකදී හා හින්දු මංගල්‍ය උත්සවයකදී යෙදෙන සංස්කෘතික යෙදුම්වල ඇති සුවිශේෂත්වය හා එයින් එම සංස්කෘතීන්හි අනන්‍යතාව පිළිබිඹු වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. විවාහය අරභයා ලෝකයේ ජාතීන් අතර හින්දූන් තරම් චාරිත්‍ර විධීන් පවත්වනු ලබන තවත් ජාතියක් නොමැත. බෞද්ධ හා හින්දු ආගමික සංස්කෘතිය පිළිබඳ රචනා වූ විවිධ කෘති මූලාශ්‍රය කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරේ. මේ අනුව, සංස්කෘතීන් දෙකෙහිම එක සමාන අර්ථ ඇති යෙදුම් යෙදෙන අතර, එලෙස නොයෙදෙන සුවිශේෂ අවස්ථා බහුලය. කෙසේ වෙතත් එකී යෙදුම් සවිස්තරාත්මකව විමසා බැලීමේදී එයින් පිළිබිඹු වන්නේ අදාළ සංස්කෘතීන්හි අනන්‍යතාවයි.

ප්‍රමුඛ පදඃ බෞද්ධ ධර්මය, විවාහය, සංස්කෘතිය, හින්දු ධර්මය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*dinuar.uok@gmail.com*
[2]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*nisharacharanga@gmail.com*